පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සති පාසල

විෂය- පෙරදිග සංගීතය

සතිය- 3

ශ්‍රේණිය - 9

සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති

ර/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 1.0 - සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.**

**නිපුණතා මට්ටම 1 .1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.**

**ක්‍රියාකාරකම 1.1.1 - භූපාලි රාගයේ සර්ගම්**

**ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.**

පැවරුම- 01

1. භූපාලි රාගයට අයත් පහත සදහන් සර්ගම් ගීත ගායනය හොඳින් ශ්‍රවණය කරන්න.

- https://youtu.be/NN8deKi3074

11. සර්ගම් ගීතය නිර්මාණයේදී සරිගපධස් යන ස්වර පමණක් යෙදෙන ආකාරය පිරික්සන්න.

111. භූපාලි රාගයට අයත් සර්ගම් ගීතය නිවැරදි ව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

1v. හැකිනම් ස්වර පුවරුවක් ආධාරයෙන් හෝ ඉහත ඔබට ලබා දී ඇති link එක ආධාර කර ගනිමින් නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීතය ගායනයට හුරුවන්න.

**භූපාලි රාගය - සර්ගම් ගීතය - ත්‍රී තාල**

| | | | | |
|---|---|---|---|---|
| **ස්ථායි** | 0<br>සˆ සˆ ධ ප<br>ග ප ධ සˆ | 3<br>ග රි ස රි<br>රිˆ සˆ ධ ප | x<br>ග - ප ග<br>සˆ ප ධ ප | 2<br>ධ ප ග -<br>ග රි ස - |
| **අන්තරා** | ග ග ප ධ<br>ගˆ ගˆ රිˆ සˆ | ප සˆ - සˆ<br>රි රි සˆ ධ | ධ ධ සˆ රිˆ<br>සˆ සˆ ධ ප | ගˆ රිˆ සˆ ධ<br>ග රි ස - |

පැවරුම- 02 ලිඛිත

1. සර්ගම් ගී යන්න නිර්වචනය කරන්න.

2. සර්ගම් ගීත ගායනයෙහි වැදගත්කම කෙටියෙන් පහදන්න.

3. භූපාලි රාගයේ ආරෝහණ අවරෝහණ ලියන්න.

පැවරුම - 03

1. අන්තර්ජාලයෙන් .භූපාලි රාගයට අයත් ශාස්ත්‍රීය ගායන/වාදන පරිශිලනයට යොමු වන්න.